# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

පොලිස් මූලස්ථානය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 189 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 02/02/2024 පැය 1140

## මාධ්‍ය නිවේදනය

<u>පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු</u>

**01.** **2024.02.01 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරින් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| **04** | **04** | **10.5** | **550** | තඹ දඟර **02**<br>යකඩ බැරල් **03** |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථාන වෙත ඉදිරිපත් කර ඇත.

**02.** **බලපත්‍ර කොන්දේසි උල්ලංඝණය කර ටිපර් රථයකින් වැලි ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ඉලුප්පුකඩවායි කඳවුර.**

2024.02.01 වන දින සවස් කාලයේ ඉලුප්පුකඩවායි පොලිස් වසමේ කූරායි ඇතිමොටේ ප්‍රදේශයේ දී පොලිස් විශේෂ කාර්ය බලකා ඉලුප්පුකඩවායි කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර බලපත්‍ර කොන්දේසි උල්ලංඝණය කර ටිපර් රථයකින් වැලි ප්‍රවාහන කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඉලුප්පුකඩවායි පොලිස් ස්ථානයට භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 52 ක් වූ යාපනය ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ. ඉලුප්පුකඩවායි පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.**

**03. අනවසරයෙන් රජයේ ඉඩමකට ඇතුළු වී එළි පෙහෙළි කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පුල්මුඩේ කඳවුර.**

2024.02.01 වන දින දහවල් කාලයේ කුච්චවේලි පොලිස් වසමේ ආලම්කුළම් ප්‍රදේශයේ දී පොලිස් විශේෂ කාර්ය බලකා පුල්මුඩේ කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර රජයේ කැළෑබද ප්‍රදේශයට අනවසරයෙන් ඇතුළු වි අක්කරයක පමණ භූමි ප්‍රමාණයක් එළි පෙහෙළි කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන කුච්චවේලි පොලිස් ස්ථානයට භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 60 ක් වූ කුච්චවේලි ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** කුච්චවේලී පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**04. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා වව්නියාව කඳවුර.**

2024.02.01 වන දින දහවල් කාලයේ වව්නියාව පොලිස් වසමේ පරණ බස් නැවතුම්පොළ ප්‍රදේශයේ දී පොලිස් විශේෂ කාර්ය බලකා වව්නියාව කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර මෙරට නිෂ්පාදිත ගිනි අවියක් අත්අඩංගුවට ගෙන වව්නියාව පොලිස් ස්ථානයට භාර දී ඇත.

**සැකකරුවන් සම්බන්ධයෙන් මෙතෙක් අනාවරණය වි නොමැති අතර වව්නියාව** පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**05. මෙරට නිෂ්පාදිත ගිනි අවි 02 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අම්පාර කඳවුර.**

2024.02.01 වන දින සවස් කාලයේ උහන පොලිස් වසමේ ලාතුගල ප්‍රදේශයේ දී පොලිස් විශේෂ කාර්ය බලකා අම්පාර කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර මෙරට නිෂ්පාදිත ගිනි අවි 02 ක් හා මුව මස් කිලෝ 07 ග්‍රෑම් 500ක් සමගින් සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන උහන පොලිස් ස්ථානයට භාර දී ඇත.

**සැකකරු වයස අවුරුදු 34 ක් වූ ලාතුගල ප්‍රදේශයේ පදිංචිකරුවකු වේ.** උහන පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**06. ගංජා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අක්මීමණ කඳවුර.**

2024.01.31 වන දින රාත්‍රී කාලයේ අක්මීමණ පොලිස් වසමේ දිවෙල්වත්ත ප්‍රදේශයේ දී පොලිස් විශේෂ කාර්ය බලකා අක්මීමණ කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර ගංජා කිලෝ 01 ග්‍රෑම් 200 ක්, තරාදි 01 හා එම ජාවාරමෙන් උපය ගන්නා බවට සැකකරන මුදල් රුපියල් 5000/- ක් සමඟ සැකකරුවෙකු අක්මීමණ පොලිස් ස්ථානයට භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 42 ක් වූ සෙල්ලකතරගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ. අක්කමීමණ** පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය
පොලිස් මාධ්‍ය කොට්ඨාසය.